# 12

# දෙමාපියන් රැක බලා ගමු

رَّبِّ ارْحَمْهُمَا كَمَا رَبَّيَانِي صَغِيرًا



**මාගේ රබ් (පරමාධිපතියාණනි) බාලවියේ ඔවුන් දෙදෙනා මා (කාරුණිකව සහ ආදරයෙන්) හදා වඩාගත් ආකාරයෙන්ම ඔවුන් දෙදෙනාට දයාන්විත වනු මැනවයි.**

**17 ; 24**

එකමත් එක් කාලයක මිනිස්සු තිදෙනක් දිග ගමනක් ගියහ. අතරමගදී රෑ බෝ වූයෙන් කන්දක පාමුල තිබූ ගුහාවක මේ තිදෙනාම ලැගුම් ගත්හ. රාත්‍රියේ දී ලොකු කළුගලක් පෙරළී ඇවිත් ගුහාවේ කට වසා ගත්තේය. පසු දිනය ද උදාවිය. ගුහාවේ විවරය වැසී තිබෙනු දුටු ඔවුහූ එය අයින් කළ නොහැකි එකක් බව වටහාගෙන තිගැස්සුණහ. මෙම අකරතැබ්බයෙන් ගැලවීම සඳහා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීමට ඔවුහූ ඉටා ගත්හ. තිදෙනාම තමන් කළ කුසල් (අමල්) වලින් ඉතාමත් හොඳම යහක්‍රියාව මතක් කර ප්‍රාර්ථනා කිරීමට තීරණය කර ගත්හ.

පළමු දෙදෙනා තමන් කළ යහ ක්‍රියාවන් මෙනෙහි ප්‍රාර්ථනා කළෙන් පසු ඔවුන්ගෙන් තුන්වැන්නා යා අල්ලාහ් මට වයෝවෘද්ධ දෙමව්පියන් සිටිනවා. සෑම රාත්‍රියකම ඔවුනට මා පානය කිරීමට කිරි දෙනවා. මගේ දරුවන්ට කිරිදෙන්නේ

දෙමව්පියන්ට දුන් පසුව ය. දිනක් මා ගෙදරට පැමිණෙන විට රෑ බෝ වී තිබුණා. එවිට ඔවුන් දෙදෙනා දැඩි නින්දේ පසු වුණා. ඔවුන්ගේ නින්දට බධා කරන්නට මට කැමැත්තක් තිබුණේ නෑ. එසේම ඔවුනට පෙර මගේ දරුවන්ට කිරි පානය කිරීමට දෙන්නට මම අකැමති වූයෙමි.

එම නිසා ඔවුන් නින්දෙන් අවදි නොකර ඔවුන්ගේ දෙපාමුල මම බලා හිටියා. මගේ දරුවන් මගේ පාමුල පානය කිරීම සඳහා කිරි ඉල්ලා අඬමින් හිටියා. ඔවුන් අඬන හඬ ඇසී මගේ දෙමව්පියන් ඇහැරුණා.

ඉන් පසු ඔවුන් කිරි පානය කළා. යා අල්ලාහ් මා මෙසේ කළේ ඔබගේ තෘප්තිය උදෙසා ය.

එනිසා මෙම කළුගල ඉවත් කර අපට පිටත් වීමට මග පාදා දෙනු මැනවි යි ප්‍රාර්ථනා කළේ ය. එලෙස ම අනෙක් දෙදෙනා ද තමන් කළ යහ ක්‍රියාවන් මෙනෙහි කරමින් ප්‍රාර්ථනා කළහ.

එවිට එම ගල ගුහා කටින් ඉවත් වූ අතර එම තිදෙනා ගුහාවෙන් පිට ව ගියෝය. (බුහාරි, මුස්ලිම්)

නබි (සල්) තුමා සහාබාවරුන්ට පැවැසූ මෙම සිද්ධිය, එම පුද්ගලයා දෙමව්පියන්ට කළ උපකාරයේ ඵලය මනාව ගෙනහැර දක්වයි. මෙහි දී තම දරුවන්ට වඩා දෙමව්පියන්ට ප්‍රමුඛතාව දැක් වූ එම පුද්ගලයාගේ ප්‍රාර්ථනාවට අල්ලාහ් වහා ම පිළිතුරු දැක්වීම සුවිශේෂීය. අල්ලාහ්ගේ තෘප්තිය හිමිවන්නේ දෙමව්පියන්ගේ තෘප්තිය ලැබුණ හොත් පමණි. ඔහුගේ ප්‍රාර්ථනාව වහා ම පිළිගනු ලැබීමටත් අනතුර ඉවත් වීමටත් හේතුව එය බව මෙම සිද්ධියෙන් පැහැදිලි වන්නේ ය.

මිනිසකු කරන යහක්‍රියාවන්ගෙන් දෙමව්පියන්ට සැළකීම වැදගත් වන්නේ ය. එය අල්ලාහ්ගේ තෘප්තිය ලැබීමට හේතුවක් වන බව පහත සඳහන් හදීසය පැහැදිලි කරන්නේ ය.

"තම දෙමව්පියන් තෘප්තිමත් කළ පුද්ගලයා අල්ලාහ් තෘප්තිමත් කළ අයක් වන්නේ ය. දෙමව්පියන් අතෘප්තිමත් කළ පුද්ගලයා අල්ලාහ් අතෘප්තිමත් කළ පුද්ගලයක් වන්නේ ය" යැයි නබි (සල්) තුමා පවසා ඇත. (බුහාරි)

දෙමව්පියන්ට යහපතක් කිරීම අල්ලාහ්ගේ ආදර කරුණාව ලබා දෙන බව පහත සඳහන් හදීසය මගින් පැහැදිලි වන්නේ ය.

"වරක් නබි (සල්) තුමාගෙන් අල්ලාහ්ට ඉතා ම කැමැති අමල් යහ ක්‍රියාව කුමක් දැයි අසන ලදි. එයට නබි (සල්) තුමාණෝ "වෙලාව නොවරදවා සලාතය ඉටු කිරීම "යැයි පැවසූහ. එයින් පසු කුමක් දැයි ඇසූ විට දෙමව්පියන්ට සැලකීම යැයි පැවසූහ. (බුහාරි, මුස්ලිම්)

අල්ලාහ්ට කීකරු වූ මුස්ලිම් වරයකු දෙවනුව කළ යුත්තේ තම දෙමව්පියන්ට සැළකීම බව අල්කුර්ආනය අණ කරන්නේ ය." දෙමව්පියන්ට සැලකීම අල්ලාහ් නියමයක් කර ඇත්තේ ය"(17:23)

කිසිවක් නොදත්, කිසිවක් කිරීමට ශක්තියක් නොමැති ව මෙලොව බිහි වන දරු වා රැක බලාගෙන අවශ්‍ය ආහාර පාන ලබා දෙමින්, දැනුම ලබා දෙමින් දෙමව්පියන් විසින් හදා වඩා ගනු ලැබේ. මේ සඳහා අතිවිශාල කැප කිරීම් කරති. දරුවා හදා වඩා ගනිති දෙමව්පියන් මෙසේ අපට කළ කැප කිරීම්වලට ප්‍රතිඋපකාරයත් කිරීමට මෙලොවෙහි දී කිසිවෙකුටත් හැකි වන්නේ නැත. එහෙයින් ඒ වෙනුවෙන් දෙමව්පිය න්ට ප්‍රතිඋපකාර කිරීම ඉස්ලාම් ඉතා දැඩි ලෙස අවධාරණය කරයි. මේ අනුව අයකු දෙමව්පියන්ට කළ යුතු යුතුකම් හා උදව් උපකාර පහත අයුරින් ගොනු කර දැක්විය හැකිය.

1. කෘතඥතාවය දැක්වීම.

2. දෙමව්පියන් වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම.

3. විනීතව කතා කිරීම හා ඔවුන්ගේ කීමට ඇහුන්කන් දීම.

4. ආදරයෙන් හා කරුණාවෙන් ඔවුන් සමඟ කටයුතු කිරීම.

5. යමක් කිරීමට පෙර දෙමව්පියන්ගෙන් අවසරය ලබා ගැනීම.

6. දෙමව්පියන්ගේ මිතුරන්ට සහ නෑදෑයින්ට සැලකීම.

මෙය හැර දෙමව්පියන් රිදවීම මහා පාපයක් බව ඉස්ලාම් අවධාරණය කරයි. දෙමව්පියන් රැකබලා ගැනීම ඊමානයට පමණක් දෙවන වන වැදගත් කරුණක් ලෙස සළකන ඉස්ලාමය ඔවුනට අපහාස කිරීම, ඔවුනට අකීකරු වීම, ඔවුනට බැණවැදීම, ෂිර්කයට පමණක් දෙවන වන මහා පාපයක් වශයෙන් නබි (සල්) තුමා අවධාරණය කර ඇත.

අන් පාපී ක්‍රියාවල යෙදෙන්නන්ට දඬුවම් පැමිණවීම කියාමාව තෙක් පමා කරන අල්ලාහ් දෙමව්පියන් රිදවන්නාට මෙලොවෙහි දී ම දඬුවම් පමුණුවන්නේ ය.

“අල්ලාහ් තආලා දෙමව්පියන්ට අවමන් කිරීමේ වරදට හැර අන් වැරදි සඳහා දඬුවම තමා කැමැති පරිදි කියාමාව තෙක් පමා කරන්නේ ය. එහෙත් මෙම වරදට දඬුවම මරණයට පෙර මෙලොවෙහිදීම ලබා දෙන්නේ ය” යැයි නබි (සල්) තුමාණෝ පැවසූහ. (බුහාරි)

එහෙයින් අපි අපගේ දෙමව්පියන්ට ගරු බුහුමන් දක්වමින් ද, ඔවුනට ඇප උපස්ථාන කිරීමෙන් ද මෙලොවෙහි හා පරලොවෙහි අල්ලාහ්ගේ තෘප්තිය ලබා ගැනීමට අධිෂ්ඨානය ඇති කරගමු.

ක්‍රියාකාරකම

දෙමව්පියන්ට ගෞරව කරමු යන මැයෙන් දේශනයක් පවත්වන්න.